## Abstract 40

# ටිබෙට් දේශයේ ප්‍රගමනය විෂයයෙහි බුදුසමයේ දායකත්වය

**ඉෂාරා මදුෂානි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*isharamadushani41@gmail.com*

*"ලෝකයේ පියස්ස"* ලෙස විරුදාවලිය ලත් ටිබෙටය බුදුදහමින් පෝෂණය වූ රටකි. විවිධ ජනප්‍රවාද හා මතවාදයන් ඔස්සේ බුදුසමය ටිබෙටයට සම්ප්‍රාප්ත වූ බවට ඇතැම් විද්වත්හු මත පළකොට තිබේ. ටිබෙටයට ස්ථිර වශයෙන් ම බුදුසමය සම්ප්‍රාප්ත වන්නේ ක්‍රි.ව. 07 වන සියවසෙහි **සොන්-ත්සන්- ගම්පෝ** රජුගේ කාලයේ දී ය. විවිධ රජවරුන් මෙන් ම ස්වදේශීය හා විදේශීය භික්ෂූන් වහන්සේලාගේ කැපවීම මත ටිබෙට් බුදුසමය බොහෝ සේ ජනප්‍රියත්වයට පත් විය. හුදෙකලාව තිබූ ටිබෙටය බුදුසමයයෙන් ඔපවත් වූ රාජ්‍යයක් බවට පත් කිරීමට භික්ෂූන් වහන්සේලාගේ දායකත්වය විශේෂයෙන් අගය කළ යුතු ය. සාම්ප්‍රදායික ඇදහිලි මත පදනම්ව තිබූ ටිබෙට් සංස්කෘතිය බුදුසමයයේ සම්ප්‍රාප්තියෙන් පසු කිසියම් සුබවාදී පරිවර්තනයකට ලක් වූ බව පෙනේ. එහි දී ආගමික වශයෙන් ස්ථාපිතව තිබූ ජන විඥානයේ සැලකිය යුතු පරිවර්තනයක් සිදු විය. එවක් පටන් විකාශය වූ ටිබෙට් ජනයාගේ ජීවන රටාව ද විශේෂ වෙනස්කම් රාශියකින් යුතුව ප්‍රවර්ධනය වන්නට විය. සංස්කෘතික වශයෙන් සිදු වූ පරිවර්තනයත් සමග සාහිත්‍යයික දියුණුව ද ඉතා වැදගත් කොට සැලකිය හැකි ය. ඒ අනුව ටිබෙට් දේශයට බුදුසමය පැමිණීමත් සමග එරට තුළ සිදු වූ පරිවර්තනයන් පිළිබඳ ආගමික, සාමාජීය හා සාහිත්‍යයික යන අංශයන්ට මූලිකත්වයක් දෙමින් විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

**ප්‍රමුඛ පද :** ටිබෙට් දේශය, බුදුසමය, සංස්කෘතිය, සාහිත්‍යය